1st Place Winner
National Productivity
Award 2020

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.03. 10 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 01/2025**

1. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත.
2. සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය, දකුණු පළාත.
3. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත.
4. සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දකුණු පළාත.
5. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත.
6. සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දකුණු පළාත.
7. පළාත් ආදායම් කොමසාරිස්, දකුණු පළාත.
8. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්, දකුණු පළාත.
9. අධ්‍යක්ෂ, කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය, වක්වැල්ල.

**රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කරගන්නා ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම**

රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති කමිටු දෙකක් හරහා සිදු වන බවත්, ඒ අනුව එකී චක්‍රලේඛ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම පහත නියෝජනයන්ගෙන් යුතු එම කමිටු මඟින් සිදු වන බවත් මෙයින් දන්වමි.

| ආයතනික පරිපාලනය හා සම්බන්ධව නිකුත් කරනු ලබන චක්‍රලේඛ | මූල්‍ය කළමනාකරණයට අදාළ චක්‍රලේඛ |
|---|---|
| 1. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) - කමිටු සභාපති | 1. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) - කමිටු සභාපති |
| 2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) - කමිටු සාමාජික | 2.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) - කමිටු සාමාජික |
| 3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) - කමිටු සාමාජික | 3.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - කමිටු සාමාජික |
| 4. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - කමිටු සාමාජික | 4.අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - කමිටු සාමාජික |
| 5. සහකාර ආණ්ඩුකාර ලේකම් - කමිටු සාමාජික | 5.අධ්‍යක්ෂ (අයවැය) - කමිටු සාමාජික |
| 6. සහකාර ප්‍රධාන ලේකම් (ආයතන) - කමිටු සාමාජික | 6.අධ්‍යක්ෂ (මුදල්) - කමිටු සාමාජික |
| 7. සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) - කමිටු සාමාජික | 7.සහකාර ආණ්ඩුකාර ලේකම් - කමිටු සාමාජික |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

02. දකුණු පළාත් මූල්‍ය රීති 562 අනුව, රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග, මඟපෙන්වීම් හා උපදෙස් සංග්‍රහ පළාත් සභාවට අදාළ කරගත හැක්කේ, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව බව සඳහන් වේ. ඒ අනුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන එවැනි චක්‍රලේඛ දකුණු පළාතට අදාළ කරගැනීම අවශ්‍ය බව පෙනී යන්නේනම් උක්ත කමිටු විසින් ලබා දෙනු ලබන නිර්දේශ සලකා බලා ගරු ආණ්ඩුකාරතුමා වෙත මාගේ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු එම චක්‍රලේඛ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සිදු වේ.

03. එක් එක් සේවාවන්ට හෝ ආයතනවලට හෝ අදාළව රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ආයතනික පරිපාලනය/මූල්‍ය කළමනාකරණය සම්බන්ධව නිකුත් කරන චක්‍රලේඛ අදාළ කරගැනීම සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ ආයතන වෙතින් විවිධ ඉල්ලීම් ඉදිරිපත් වන අතර, ඇතැම් ඉල්ලීම් නිසි නිල මඟින් ඉදිරිපත් නොවන බවත්, නිසි නිල මඟින් ඉදිරිපත් වන ඉල්ලීම් සමඟ එකී චක්‍රලේඛ පළාත් සභාවට අදාළ කර ගැනීම සම්බන්ධව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ නිර්දේශ රහිතව ඉදිරිපත් වන අවස්ථා පවතින බවත් ම විසින් නිරීක්ෂණය කර ඇත.

04. එබැවින්, ආයතනික පරිපාලනය හෝ මූල්‍ය කළමනාකරණය හෝ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ සම්බන්ධ ඉල්ලීම් මින් මතු නිසි නිල මඟින් ඉදිරිපත් කළ යුතු බවත්, ඉල්ලීමට අදාළ වන චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වන ඔබගේ නිර්දේශ සමඟින් ඉදිරිපත් කළ යුතු බවත් මෙයින් අවධාරණය කරමි. දකුණු පළාත් සභාවේ සියලු නිලධරයින්ට අදාළව නිකුත් වන චක්‍රලේඛ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් කටයුතු කරනු ඇත.

05. රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ මත පදනම්ව, ඇතැම් චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම් සම්බන්ධ ඔබගේ නිර්දේශ ප්‍රධාන ලේකම් කාර්යාලයීය චක්‍රලේඛ කමිටුවේ අවශ්‍යතාව අනුව කැඳවනු ලැබිය හැකි බව ද සිහිපත් කරමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**දුරකථන : 091-49 44 007** **ෆැක්ස් : 091-22 32 691** **විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com**